# ක්‍රියාකාරකම් පත්‍රිකාව

## අවිනිශ්චිත ගිණුම- ශේෂ පිරික්සුමේ ඵෙක්‍ය කෙරෙහි බල නොපාන වැරදි

**1) හරි වැරදි ලකුණු කරන්න.**

I. ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා නිවැරදි ගිණුම්කරණ තොරතුරු අවශ්‍ය වේ. ( )

II. මූලික සටහන් පොත් වල ගණුදෙනු සටහන් කිරීමේදී වැරදි සිදුවිය නොහැකිය. ( )

III. ලෙජර් ගිණුම් තුලනය කිරීමේදී හෝ ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී ගිණුම්කරණ වැරදි සිදුවිය හැකිය. ( )

IV. ශේෂ පිරික්සුම සමාන වුවහොත් ගිණුම්කරණ ක්‍රියාවලියේ වැරදි තිබිය නොහැකිය. ( )

V. ශේෂ පිරික්සුමේ සමානත්වයට බල නොපාන වැරදි නිවැරදි කිරීමට අවිනිශ්චිත ගිණුම යොදා ගනී. ( )

**2) ශේෂ පිරික්සුමේ ඵෙක්‍යය අතර වෙනසක් ඇති නොකරන වැරදි මොනවාදැයි පහත ලැයිස්තුවෙන් තෝරන්න.**

I. රු. 1000ක දුරකථන ගාස්තු ගෙවීමක් දුරකථන ගාස්තු ගිණුමේ පමණක් සටහන් වී තිබීම.

II. රු. 10000ක ගැණුම් ඉන්වොයිසියක් පොත් වලින් සම්පූර්ණයෙන්ම මඟ හැරී තිබීම.

III. රු. 2000ක් වූ විදුලි වියදම රු. 200ක් සේ පොත්වල සටහන්වී තිබීම.

IV. ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා ගෙවූ රු.8000ක් ගොඩනැගිලි ගිණුමේ සටහන් වීම.

V. දුන් වට්ටම් වූ රු.500ක් රම ගිණුමේ දෙවරක් සටහන්වීම.

අන්තර්ගතය :- ජේ.ඒ.සෝමලතා
සැකසුම :- ඩී.එම්.එස්.ආර්.දිසානායක-ව/ම/ම/ ඇඹලේගොඩ ම.වි.

**3) යා කරන්න**

I. ණයගැති ගිණුම හර 12000
විකුණුම් ගිණුම බැර 12000

II. ණය හිමි ගිණුම හර 2000
ලද වට්ටම් ගිණුම බැර 2000

III. ණය හිමි ගිණුම හර 10000
ගැණුම් ගිණුම බැර 10000

IV. කාර්යාල උපකරණ හර 20000
ගැණුම් ගිණුම බැර 20000

V. වරිපනම් ගාස්තු ගිණුම හර 2000
විදුලි වියදම් ගිණුම බැර 2000

A. මිලදී ගත් කාර්යාල උපකරණ ගැණුම් ගිණුමේ සටහන් වී තිබීම.

B. රු. 10000 ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන්වීමේ වරද නිවැරදි කිරීම.

C. රු. 12000ක් අඩුවෙන් සටහන් වූ ණයට විකිණුම් සටහන් කිරීම.

D. රු. 1500ක් වූ වට්ටම් මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ 1300ක් ලෙස සටහන්වීම.

E. වරිපනම් ගාස්තු රු. 2000 විදුලි වියදම් ගිණුමේ සටහන් වී තිබීම.

**4) හිස්තැන් පුරවන්න.**

1. රු.5000ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මඟ හැරී තිබීම.
→ හර ______
→ බැර ______

2. රු. 25000ක් වූ ගැණුම් ඉන්වොයිසියක් රු. 2500ක් ලෙස ගැණුම් ජර්නලයේ සටහන්වීම.
→ හර ______
→ බැර ______

3. ණය හිමියන්ගෙන් ලද රු. 1500ක් මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ රු. 1300ක් ලෙස සටහන්වීම.
→ හර ______
→ බැර ______

4. කාර්යාලයට මිලට ගත් ලිපි ද්‍රව්‍ය කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබීම.
→ හර ______
→ බැර ______

5. ගෙවූ විදුලි වියදම් රු.3000ක මුදල් පොතේ මෙන්ම විදුලි වියදම් ගිණුමේද දෙවරක් සටහන් කිරීම.
→ හර ______
→ බැර ______

The National e-learning Portal for The General Education

අන්තර්ගතය :- ජේ.ඒ.සෝමලතා
සැකසුම :- ඩී.එම්.එස්.ආර්.දිසානායක-ව/ම/ම/ ඇඹලේගොඩ ම.වි.

**5) ශේෂ පිරික්සුමේ ඓක්‍යය අසමාන වීම කෙරෙහි බලපාන වැරදි නිවැරදි කරමු.**

A. වැරැද්ද සිදුවී ඇති ස්ථාන හඳුනාගන්න.

B. නිවැරදි කිරීමේ ගිණුම් සටහන පොදු ජර්නලයේ තබන්න.

C. ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන්න.

D. නිවැරදි කළ යුතු ආකාරය තීරණය කරන්න.

E. අවිනිශ්චිත ගිණුම ආශ්‍රිතව ගිණුම් නිවැරදි කරන්න.

ඉහත දක්වා ඇත්තේ ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරදි නිවැරදි කරන ආකාරයට අදාල වන පියවර කිහිපයකි.ඒවා අනුපිළිවෙලට ගැළපූ පසු නිවැරදි පිළිතුර තෝරන්න.

I. A, B, C, D, E
II. A, C, B, D, E
III. C, D, A, B, E
IV. C, A, D, B, E

**6) ගෙවන ලද රු. 1200ක විදුලි වියදම් ගිණුමේද බැර පැත්තේ සටහන් වීමේ වරද නිසා,**

I. ශේෂ පිරික්සුමේ හර පැත්ත රු.1200කින් වැඩිවේ.
II. ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 2400කින් අඩුවේ.
III. ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු.2400කින් අඩුවේ.
IV. ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු.1200කින් වැඩිවේ.

The National e-learning Portal for The General Education

අන්තර්ගතය :- ජේ.ඒ.සෝමලතා
සැකසුම :- ඩී.එම්.එස්.ආර්.දිසානායක-ව/ම/ම/ ඇඹලේගොඩ ම.වි.